Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**9 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **44 S**

**නැටුම් ( දේශීය)** **කාලය පැය දෙක හමාරයි**

ඇතුළත් වීමේ අංකය : ..........................................................................................................

**• වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහි මූලික අංගහාරය වන්නේ,
(i) පාසරඹයි (ii) ගොඩ සරඹයි (iii) මණ්ඩියයි (iv) රංග වින්‍යාසයයි

02. නර්තනයේ දී ශරීරය .................... යනුවෙන් කොටස් තුනකට බෙදා දැක්වේ.
(i) ඉහළ, පහළ, මධ්‍ය (ii) විලම්භ, මධ්‍ය, ද්‍රැත (iii) අංග, ප්‍රත්‍යාංග, උපාංග (iv) හිස, කඳ, පාද

03. නර්තන නිර්මාණයක දී තාලානුකූල, රිද්මයානුකූල හා ................. චලන යොදා ගැනීම සිදු කෙරේ.
(i) ස්ථිතික (ii) සංචාරී (iii) නිහඬ (iv) ප්‍රකාශනාත්මක

04. "මුහුදු ගිය තම පුතා එනතුරු බලා සිටිය මවට පුතු මිය ගිය බව ආරංචි වේ." මෙම අවස්ථාව නිරූපණය කිරීමේ දී ...................... නමැති ස්ථායි භාවය වැඩි වශයෙන් ප්‍රදර්ශනය වේ.
(i) ශෝකය (ii) කරුණාව (iii) සතුට (iv) ක්‍රෝධ

05. වෘත්තියමය ගැමි නැටුමක් ලෙස ................... නැටුම නම් කළ හැක.
(i) ලී කෙළි (ii) පන් නෙලීම (iii) කළගෙඩි (iv) චාමර

06. එකොළොස්වන පාසරඹය .............. නමින් හඳුන්වනු ලැබේ.
(i) චක්‍ර අඩිය (ii) සුරල් අඩිය (iii) තුම්පැති අඩිය (iv) දෙපැති අඩිය

07. මාත්‍රා 4 + 4 තනි තිතට .................. වන්නම නර්තනය කළ හැකි වේ.
(i) හනුමා (ii) වෛරොඩි (iii) තුරඟා (iv) සිංහරාජ

08. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩයේ සම්මත දිග .................
(i) තුන්වියත් තුනඟුලකි. (ii) එක් වියත් තුනඟුලකි.
(iii) පස්වියත් තුනඟුලකි. (iv) තුන් වියත් මිටි රියනකි.

09. ගැටබෙරයේ දකුණු ඇස ආරක්ෂා කිරීම සඳහා ................... යොදා ගනී.
(i) කැපුම් හම (ii) කයිපුඩි වළල්ල (iii) සූරත් තට්ටුව (iv) වැහුම් කොළය

10. පංච තූර්ය වාදනයට අනුව ආතත හා විතත වර්ගයට අයත් වන භාණ්ඩ වන්නේ,
(i) දවුල සහ තම්මැට්ටම (ii) දවුල සහ රබාන
(iii) උඩැක්කිය සහ දවුල (iv) ගැටබෙරය සහ තම්මැට්ටම

**• අංක 11 - 13 දක්වා ප්‍රශ්නවලට වගුව ආශ්‍රයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.**

| පේළිය | **A** තීරුව | **B** තීරුව | **C** තීරුව |
|---|---|---|---|
| 1 | හක්ගෙඩිය | පඩුවස්දෙව් රජු | තිසර |
| 2 | ගැටබෙරය | සේරමාන් රජු | සැළලිහිණිය |
| 3 | පන්තේරුව | මහා පරාක්‍රමබාහු රජු | පරවිය |
| 4 | තාලම්පට | දුටුගැමුණු රජු | සැවුල් |

11. කොහොඹා කංකාරි කථා පුවතට සම්බන්ධ රජු පිළිබඳ සඳහන් වන්නේ ,
(i) 1 පේළියේ B තීරුවේය. (ii) 2 පේළියේ B තීරුවේය.
(iii) 3 පේළියේ B තීරුවේය. (iv) 4 පේළියේ B තීරුවේය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

12. පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයේ දී සුසිර ගණයට අයත් භාණ්ඩය සඳහන් වන්නේ,
   (i) 1 පේළියේ A තීරුවේය. (ii) 2 පේළියේ A තීරුවේය.
   (iii) 3 පේළියේ A තීරුවේය. (iv) 4 පේළියේ A තීරුවේය.

13. "ලෙළදුන් නවතඹ පළුවන් පාදේ...." මෙම කවි පදය ඇතුළත් සංදේශ කාව්‍ය දැක්වෙන්නේ,
   (i) 1 පේළියේ C තීරුවේය. (ii) 2 පේළියේ C තීරුවේය.
   (iii) 3 පේළියේ C තීරුවේය. (iv) 4 පේළියේ C තීරුවේය.

- **අංක (14 - 20) දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට නිවැරදි පිළිතුර ලියන්න.**

14. "අක්කෙ අක්කෙ අර බලන්නකෝ" යන ගීතය ................................................................ මහතාගේ පද රචනයකි.

15. ආමද්, පරන් යන නර්තන අංග ........................................................................... නර්තන සම්ප්‍රදායට අයත් වේ.

16. අතිශයෝක්ති ලක්ෂණ ඇතුළත් වන්නේ .................................................... නාට්‍ය තුළය.

17. කරදිය මුද්‍රා නාට්‍ය .................................................... මහතා විසින් නිර්මාණය කරන ලදී.

18. "නටන ගහපතියා විසින් පවරා දෙන ලදී" යන්න ....................................................... සෙල් ලිපියේ සඳහන් වේ.

19. "ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට" යන පන් නෙලීමේ කවි පදය මාත්‍රා .................................................... තනි තිතට ගායනය කරනු ලැබේ.

20. වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඇතුළත් වන්නේ ගම්පොළ යුගයේ රචනා වී ඇති ................................. සංදේශ කාව්‍යයේය..

- **අංක 21 - 25 තෙක් දක්වා ප්‍රශ්නවලට පිළිතුරු A, B කොටස් වලින් යා කරන්න.**

| A | | B |
|---|---|---|
| 21. ගරානා | 1. | නරි බෑනා |
| 22. දයානන්ද ගුණවර්ධන | 2. | ජායිපූර් |
| 23. චිත්‍රසේන | 3. | සීතාහරණ |
| 24. ප්‍රථම මුද්‍රානාට්‍ය | 4. | පහතරට |
| 25. විල්සන් බලබොඩුව | 5. | චන්ඩාලිකා |

- **අංක (26 - 30) තෙක් දක්වා ඇති දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර පහත වරහන් තුළින් තෝරා ලියන්න.**
  **(දවුල, තම්මැට්ටම, පඬුවස්දෙව්, සේරමාන්, බිර්ජු මහාරාජ්)**

26. හැටපස් මංගල්‍යයට අනුව දිවිදෝෂය ......................................... රජුට වැළදුනි.

27. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ......................................... වේ.

28. පංචතූර්ය වාද්‍යභාණ්ඩ වර්ගීකරණය කිරීමේ දී ......................................... විතත භාණ්ඩයක් ලෙස දක්වයි.

29. පහන්මඩු ශාන්තිකර්මය ......................................... රජුට කළ ශාන්තිකර්මයකි.

30. ......................................... කථක් නර්තන සම්ප්‍රදායට සම්බන්ධ කලාකරුවෙකි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## නර්තනය - II

- **ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. i. මාත්‍රා 4 + 4 තනි තිතට බෙරපදයක් ප්‍රස්තාර කරන්න.
    ii. සිංහරාජ වන්නමේ අඩව්ව ලියන්න.

02. i. ගැට බෙරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
    ii. ගැටබෙරයේ රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න.

03. i. පොළොන්නරු යුගයට අයත් සෙල්ලිපියක් නම් කොට එහි ඇතුළත් තොරතුරු දක්වන්න.
    ii. ගම්පල යුගයට අයත් සංදේශ කාව්‍යයක් උදාහරණයට ගනිමින් ඒ තුළ වද්‍ය භාණ්ඩ තිබුණු බවට පැහැදිලි කරන්න.

04. i. කථක් නර්තනය ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් දෙදෙනෙක් නම්කර එක් අයෙකු පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.
    ii. කථක් නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය හඳුන්වා, එම සම්ප්‍රදායට අයත් නර්තන අංග 4 ක් ලියන්න.

05. i. ශ්‍රී ලංකාවේ ප්‍රචලිත නාට්‍ය වර්ග 4 නම් කරන්න.
    ii. ඔබ කැමති නාට්‍ය වර්ග දෙකක් හඳුන්වන්න.

06. ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා නර්තනයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
## නැටුම් ( දේශීය) - (ප්‍රායෝගික)

### 9 ශ්‍රේණිය

01. 7, 8, 9 ගොඩසරඹවලින් ඔබ කැමති ගොඩ සරඹයක් සහ එයට අදාළ කස්තිරම නර්තනය කරන්න. (ල. 10)

02. සිංහරාජ වන්නමට අදාළ කවි පදයන් සහ එක් මාත්‍රයක් සහ කස්තිරම නර්තනය කරන්න. (ල. 10)

03. පන් නෙලීම හෝ ගොයම් කැපීම හා ගැමි නැටුම් වලින් ඔබ කැමති ගැමි නැටුමේ කවි දෙකකට නර්තනය කරන්න. (ල. 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
## නැටුම් ( දේශීය)

## 9 ශ්‍රේණිය

I - පත්‍රය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 02. | 3 | 03. | 4 | 04. | 1 | 05. | 2 | 06. | 1 |
| 07. | 4 | 08. | 1 | 09. | 3 | 10. | 4 | 11. | 1 | 12. | 1 |
| 13. | 3 | | | | | | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14. | ආනන්ද සමරකෝන් | 15. | කථක් | 16. | ශෛලිගත |
| 17. | චිත්‍රසේන ඩයස් | 18. | සැස්සේරුව | 19. | 3 (මැදුම්) |
| 20. | තිසර | 21. | 2 | 22. | 1 |
| 23. | 5 | 24. | 3 | 25. | 4 |
| 26. | පඬුවස්දෙව් | 27. | දවුල | 28. | තම්මැට්ටම |
| 29. | සේරමාන් | 30. | බිර්ජු මහාරාජ් | | |

(ලකුණු 30)

II - පත්‍රය

01. i. නිවැරදි ප්‍රස්තාරයට (ලකුණු 4)
ii. නිවැරදිව ලියා තැබීමට (ලකුණු 6) } 10

02. i. හැඳින්වීම • උඩරට වාද්‍ය භාණ්ඩය බව • දැව වර්ග • මිනුම් ක්‍රම • අක්ෂර වර්ග (ලකුණු 04)
ii. ගැටබෙරයේ නිවැරදි රූපසටහනට (ලකුණු 02)
(කොටස් නම් කිරීම එකකට 1/2 බැගින් කොටස් 8 ක්වත් නම් කළ යුතුයි) (ලකුණු 04) } 10

03. i. නම් කිරීමට හා විස්තරයට විස්තර කිරීමට (ලකුණු 04)
ii. කවිය ලියා පැහැදිලි කිරීමට (6ය) (ලකුණු 06) } 10

04. i. නම් කිරීමට හා විස්තර කිරීමට (ලකුණු 04)
ii. සංගීත සම්ප්‍රදාය නම් කිරීමට 02 නර්තන අංග 4 ක් ලිවීමට 04 (ලකුණු 06) } 10

05. i. නාට්‍ය වර්ග 4 නම් කිරීමට (ලකුණු 04)
ii. හඳුන්වා විස්තර කිරීමට } 10
06 වැදගත්කම ඉදිරිපත් කිරීම (ලකුණු 06)

සමස්ත ලකුණු (ලකුණු 10)

| | | |
|---|---|---|
| I ප්‍රශ්න පත්‍රයට | 30 | |
| II ප්‍රශ්න පත්‍රයට | 40 | (10 x 4) |
| III ප්‍රායෝගික පත්‍රයට | 30 | |
| මුළු ලකුණු | 100 | |